ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

தேசிய போக்குவரத்து மருத்துவ நிறுவகம்

National Transport Medical Institute

2023

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

පටුන

	පිටු අංකය
හැඳින්වීම	1
දැක්ම	1
මෙහෙවර	1
පරමාර්ථ	1
ආයතනයේ කාර්යයන්	1
සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය	2
විගණන හා කළමනාකරණ කමිටුව	2
ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	3
ආයතනික තොරතුරු	3
සභාපතිතුමාගේ පණිවුඩය	5
2023 වර්ෂයේ කාර්ය සාධනය	7-13
විගණකාධිපති වාර්තාව	14-21
විගණන විමසුම සඳහා ගත් ක්‍රියාමාර්ග	22-24
2023 වර්ෂයේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග	25-27

අවසන් ගිණුම් වාර්තාව

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	28
මූල්‍ය කාර්යසාධන වාර්තාව	29
හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය	30
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	31
ගණකාධිකරණ ප්‍රතිපත්ති හා ගිණුම් සඳහා සටහන්	32-47
සත්‍යය සහ අයවැයගත සැසඳුම් ප්‍රකාශය	48-51
ශාඛා කාර්යාල ලාභය	52

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

1. හැඳින්වීම

සීමාසහිත සවුත් වෙස්ටර්න් බස් සමාගමට අයත්ව, එහි සේවක සේවිකාවන් හට වෛද්‍ය පහසුකම් සැපයීම සඳහා වෛද්‍ය මධ්‍යස්ථානයක් ලෙස රත්මලාන ඩිපෝ පරිශ්‍රයේ පිහිටුවා තිබූ මෙම ආයතනය 1958 බස් සමාගම් ජනසතු කිරීමත් සමඟ ම ලංකා ගමනාගමන මණ්ඩලය සතු විය. බස් ජන සතුවෙන් පසුව "ලංගම වෛද්‍ය කොට්ඨාශය" නමින් මෙය හඳුන්වන ලදී.

සේවා පුළුල් කිරීමේ අරමුණින් රත්මලාන ඩිපෝ පරිශ්‍රය තුළ පිහිටුවා තිබූ වෛද්‍ය මධ්‍යස්ථානය, 1970 වර්ෂයේදී ලංගමය සතුව තිබූ නුගේගොඩ, හයිලෙවල් පාර, අංක : 170 දරණ ස්ථානයට ගෙන එන ලද අතර, වර්තමානයේ "ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය" යන නමින් ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ස්වයං ආදායම් උත්පාදන රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වේ.

1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත මගින් ස්ථාපිත කර ඇත. ආයතනයේ මූලික අරමුණු ඉටුකර ගැනීම උදෙසා, 1999 නුගේගොඩ ප්‍රධාන කාර්යාලයෙන් ආරම්භ වී මේ වන විට දිස්ත්‍රික්ක විසිපහ තුළම ව්‍යාප්ත වී ඇති ශාඛා කාර්යාල ජාලයකින් සමන්විත වේ.

2. දැක්ම

"සෑම සුක්කානමක් පිටුපසම නිරෝගීමත් රියදුරකු හිඳුවීම."

3. මෙහෙවර

"ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහන වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වෙමින් සියලුම රියදුරු බලපත්‍ර අපේක්ෂකයන්ට අධ්‍යාත්මික හා ගුණාත්මක වෛද්‍ය පරීක්ෂණ සිදුකර ශාරීරික හා මානසික යෝග්‍යතාවය පිළිබඳ සහතික කිරීම."

4. පරමාර්ථ

- සියලු ම රියදුරු බලපත්‍ර අයදුම්කරුවන්ගේ ශාරීරික සහ මානසික යෝග්‍යතාවය පරීක්ෂා කර බැලීම.
- නිකුත් කරනු ලබන වෛද්‍ය සහතිකයේ ගුණාත්මක බව හා ආරක්ෂක උපක්‍රම වර්ධනය කිරීම.
- මනා මානව සම්පත් කළමනාකරණය තුළින් සේවාවේ ගුණාත්මක බව ළඟා කර ගැනීම.

5. ආයතනයේ ප්‍රධාන කාර්යයන්

බර වාහන රියදුරන්, සැහැල්ලු වාහන රියදුරන්, රියදුරු පාසැල්වලින් පුහුණුව ආරම්භ කිරීමට අපේක්ෂිත සියලු දෙනා, ගරු අධිකරණය, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ඇතුළු වෙනත් බාහිර ආයතන මගින් යොමුකරන රියදුරන්ගේ වෛද්‍ය පරීක්ෂණ සිදුකර ඔවුන්ගේ යෝග්‍යතාවය සහතික කොට වෛද්‍ය සහතික නිකුත් කිරීම මෙම ආයතනයේ ප්‍රධාන කාර්යය වන්නේය.

සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී	-	**වෛද්‍ය එස්.ඒ.කේ. ගමගේ මහතා** (2023 ජනවාරි මස දක්වා) **ජේ.ඒ.ඩී.බී. අබේරත්න මහතා** (2023.02.15 දින සිට)
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්	-	වී.පී.සී.ආර්. අබේගුණවර්ධන මහත්මිය (2023.10.15 දින දක්වා) ඩබ්.ඒ.සී.කේ. විතාන මිය (2023.10.26 දින සිට) පී.වී.බී.පී. සිසිර නන්දන මහතා ඉන්දික හපුගොඩ මහතා පී.ඩබ්.සී.එල්. පනාපිටිය මහතා වෛද්‍ය ජී.එන්. ෆොන්සේකා මිය නිලාන් මිරැන්ඩා මහතා (2023.09.07 දින දක්වා) එස්.ආර්. ගොඩමුණේ මහතා (2023.10.02 දින සිට) වෛද්‍ය එච්.එච්.පී. ක්‍රිශාන්ත මහතා (2023.12.14 දින දක්වා) වෛද්‍ය රුවන් විජයමුණි මහතා (2023.02.17 දින සිට) එන්.එච්. සමරතුංග මහතා (2023.05.10 දින සිට)
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	-	එච්.එම්.කේ.සී. හේරත් මිය (2022.03.22 දින සිට)
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	-	සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩල රැස්වීම් එකොළහක් පැවැත්විණි.

විගණන හා කළමණාකරණ කමිටු

විගණන හා කළමණාකරණ කමිටු සාමාජිකයන් -

සභාපති	-	පී.වී.බී.පී. සිසිර නන්දන මහතා
සාමාජික	-	වී.පී.සී.ආර්. අබේගුණවර්ධන මහත්මිය (2023.10.12 දින දක්වා) ඩබ්.ඒ.පී.කේ. විතාන මිය (2023.12.06 දින සිට)
සාමාජික	-	නිලාන් මිරැන්ඩා මහතා (2023.06.12 දින දකවා) එස්.ආර්. ගොඩමුණේ මහතා (2023.10.12 දින සිට)
නිරීක්ෂක	-	එම්.එම්.එෆ්. ෆිදර්විෂියා මහත්මිය (2023.02.28 දින සිට)
නිරීක්ෂක	-	පී.කේ.එම්.ඩී. ගුණසේන මහතා (2023.10.12 දින දක්වා) කේ.ඩබ්.පී.එස්. ජයමිණි මිය (2023.12.06 දින සිට)
අධ්‍යක්ෂක (පරිපාලන/මූල්‍ය)	-	ටී.ජී. ලක්ෂ්මන් මහතා
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	-	වෛද්‍ය කේ.එස්.එම්. සමරසේකර මිය
ගණකාධිකාරී	-	එස්.පී.ඒ.එස්. දිසානායක මහතා
අභ්‍යන්තර විගණක	-	එල්.එම් ජයලත් මහතා
සහකාර අධ්‍යක්ෂක (පරිපාලන)	-	එම්.ඩී.සී.ඩී. පෙරේරා මහතා
පරිපාලන නිලධාරී	-	එච්.එච්.ආර්.කේ. හේරත් මිය
ලේකම්	-	එච්.එම්.සී.කේ. හේරත් මිය

විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් - සමාලෝචිත වර්ෂය තුළ කමිටු රැස්වීම් හතරක් පැවැත්විණි.

ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

අධ්‍යක්ෂක (පරිපාලන/මූල්‍ය)	-	ටී.ජී. ලක්ෂ්මන් මහතා
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	-	වෛද්‍ය කේ.එස්.එම්. සමරසේකර මිය
ගණකාධිකාරී	-	එස්.පී.ඒ.එස්. දිසානායක මහතා
අභ්‍යන්තර විගණක	-	එල්.එම්. ජයලත් මහතා
නීති නිලධාරී/ අධ්‍යක්ෂක මණ්ඩල ලේකම්	-	එච්.එම්.සී.කේ. හේරත් මිය
අධ්‍යක්ෂක (පරිපාලන)	-	එම්.ඩී.සී.ඩී. පෙරේරා මහතා
පරිපාලන නිලධාරී	-	එච්.එච්.ආර්.කේ. හේරත් මිය

ආයතනික තොරතුරු

ආයතනයේ ලියාපදිංචි කාර්යාලීය දුරකථන අංකය	-	0112-812796
කාර්යාලීය ෆැක්ස් අංකය	-	0112-812795
කාර්යාලීය ඊමේල් ලිපිනය	-	ntmi@sltnet.lk
කාර්යාලීය වෙබ් ලිපිනය	-	www.ntmi.lk

සභාපතිතුමාගේ පණිවුඩය



ආයතනයේ ඉදිරි දැක්මට අනුගත වෙමින් 1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතින් පවරා ඇති බලතල පරිදි, ශ්‍රී ලංකාව තුළ සිටින බර වාහන මෙන්ම සැහැල්ලු වාහන රියදුරන්ගේ සෞඛ්‍යමය තත්ත්වය පිළිබඳව උසස් හා ගුණාත්මක වෛද්‍ය පරීක්ෂණයක් සිදු කර, ඒ අනුව වෛද්‍ය සහතික නිකුත් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය හා දිවයින පුරා විහිදී ඇති ශාඛා කාර්යාල 25ක් මඟින් අවශ්‍ය සේවා සම්පාදනය කර ආයතනයේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කරමින් සිටියි.

ඒ අනුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය අතර සේවා මාර්ගගත ක්‍රමය ඔස්සේ සම්බන්ධ කර වෛද්‍ය සහතික සුහුරු තාක්ෂණය මඟින් ලබාදීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට දැනටමත් කටයුතු සිදු කරමින් පවතී.

තවද, වර්තමානයේ ශ්‍රී ලාංකික ප්‍රජාව මුහුණ දෙන විශාල ගැටළුවක් වන්නේ රිය අනතුරු සංඛ්‍යාව ඉහළ යෑමේ ප්‍රවණතාවයි. ඒ අනුව දිනකට රිය අනතුරුවලින් මිය යන ප්‍රමාණය දැනට අටක් දක්වා වාර්තා වන අතර ඉදිරියේදී එම අගය අවම කිරීම ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වගකීමයි. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය ජාත්‍යන්තර වෛද්‍ය නිර්ණායකයන්ට අනුව යමින් දකුණු ආසියාවේ එකම හා ප්‍රමුඛ වෛද්‍ය ආයතනය බවට පත් කිරීම මාගේ අභිලාෂයයි. ජාතික ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සභාපතිවරයා වශයෙන් මෙම ආයතනයට පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂය තුළ සිදු වී ඇති ප්‍රගතියට දායකත්වය ලබා දී ඇති එම වර්ෂයේ සිටි අධ්‍යක්ෂ මණ්ඩලය, ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අනෙකුත් කාර්ය මණ්ඩලයට ස්තුති පූර්වක වන අතරම, ආයතනයේ සභාපතිවරයා වශයෙන් තවදුරටත් මෙම ආයතනය මඟින් සේවාදායකයන්ට කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීම කෙරෙහි අවධානය යොමු කරවමි.

ජේ.ඒ.බී.බී. අබේරත්න

සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී
ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

2023 වර්ෂයේ කාර්ය සාධනය

2023 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය දක්වා රියැදුරු බලපත්‍ර අපේක්ෂකයින්ගේ වෛද්‍ය පරීක්ෂණ සිදුකොට වෛද්‍ය සහතික නිකුත් කිරීම පිළිබඳ විග්‍රහයක් පහත දක්වා ඇත.


2023 දෙසැම්බර් මස 31 දින දක්වා

ශාඛාව	සිදුකරන ලද මුළු වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව	සෞඛ්‍යය හේතූන් මත වෛද්‍ය පරීක්ෂණය තාවකාලිකව අසමත් වූ රියදුරන් හා රියදුරු බලපත්‍ර අපේක්ෂකයින් සංඛ්‍යාව	තාවකාලිකව අසමත් වූ රියදුරන් හා රියදුරු බලපත්‍ර අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය
ප්‍රධාන කාර්යාලය	118,975	5,968	5.02%
වේරහැර	87,016	6,618	7.61%
ගම්පහ	76,014	5,177	6.81%
කළුතර	40,905	2,261	5.53%
මහනුවර	55,870	4,159	7.44%
මාතර	28,976	1,524	5.26%
ගාල්ල	40,173	3,334	8.30%
හම්බන්තොට	38,549	2,082	5.40%
කුරුණෑගල	80,236	6,515	8.12%
අනුරාධපුර	43,523	2,445	5.62%
රත්නපුර	28,872	801	2.77%
බදුල්ල	21,833	1,284	5.88%
මොණරාගල	18,195	1,749	9.61%
යාපනය	30,552	1,753	5.74%
මන්නාරම	4,409	250	5.67%
වවුනියාව	11,104	599	5.39%

කිලිනොච්චිය	9689	296	3.06%
මඩකලපුව	25,593	1,198	4.68%
ත්‍රිකුණාමලය	18,900	1,468	7.77%
අම්පාර	20,768	2,203	10.61%
මාතලේ	22,329	1,531	6.86%
කෑගල්ල	27,455	2,321	8.45%
මුලතිව්	4,691	352	7.50%
නුවරඑළිය	16,000	1,286	8.04%
පොළොන්නරුව	18,537	1,628	8.78%
පුත්තලම	28,230	2,001	7.09%
එකතුව	917,394	60,803	6.63%

2023 දෙසැම්බර් මස 31 දක්වා සිදු කරන ලද මුළු වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව 917,394ක් වේ. එමඟින් 2023 දෙසැම්බර් මස 31 දක්වා සෞඛ්‍යමය හේතූන් මත රියදුරු වෘත්තියේ යෙදවීමට නුසුදුසු බවට වෛද්‍යවරුන් විසින් නිගමනය කර ඇති ප්‍රමාණය 6.63%ක් වේ. එනම් පරීක්ෂණ සඳහා ඉදිරිපත් වූ සෑම අපේක්ෂකයන් 100 දෙනෙකුගෙන් 6-7% ත් අතර සංඛ්‍යාවක් සෞඛ්‍යමය හේතූන් මත රිය පැදවීමට නුසුදුසු බවට තහවුරු වී ඇත.

වෛද්‍ය පරීක්ෂණ සිදු කිරීමේදී හඳුනාගත් රෝගාබාධ පහත සඳහන් පරිදි වේ.




හඳුනාගත් රෝගාබාධවලින් වැඩි ප්‍රතිශතයකට හේතුව ඇස් පෙනීමේ දුර්වලතාවය නිසා බව ඉහත ප්‍රස්ථාරයෙන් පැහැදිලි වේ.

යටිතල පහසුකම් සංවර්ධනය

- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වවුනියාව ශාඛාව, වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ ගොඩනැගිල්ලක ස්ථාපනය කිරීමට කටයුතු කිරීම සහ මාසික කුලී පදනම මත තෝරා ගත් නුවරඑළිය ශාඛා කාර්යාලයේ අභ්‍යන්තර ව්‍යූහය සකස්කර නවීකරණ කටයුතු සිදු කිරීම.









මහජනතාවට වඩා යහපත් සේවාවක් ලබා දීම සඳහා
සේවා පුළුල් කිරීම සහ ක්‍රමවේදයන් හඳුන්වාදීම.

■ ජංගම සේවාවන් හා ප්‍රදර්ශන ක්‍රියාත්මක කිරීම.

දිනය	ස්ථානය
2023.01.09, 10	ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සවුත් ඒසියා ගෙට්වේ ටර්මිනල් (SAGT) ආයතනයේ සේවකයින් සඳහා ජංගම රියදුරු බලපත්‍ර යාවත්කාලීන කිරීමේ වැඩසටහනක් පැවැත්වීම
2023.01.05, 06, 07	මහර වෙසක් කලාපයේ වෛද්‍ය සායනයට සහභාගී වීම.

2023.05.28	"සුරැකි මඟකට තබමු පියවර" යන තේමාව පෙරදැරිව ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සියලුම ග්‍රාම නිලධාරී වසම් වල වෙසෙන පුද්ගලයන් හට සහනදායී වැඩපිළිවෙලක් මඟින් රියදුරු බලපත්‍ර ලබා දීමේ වැඩසටහනේ පළමු පියවර මාතලේ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන භූමිය තුළ ක්‍රියාත්මක කිරීම.
2023.06.03, 04, 05	'ධර්ම රෂ්මි' හෝමාගම, පිටිපන පොසොන් කලාපයේ පැවති වෛද්‍ය සායනයට සහභාගී වීම.
2023.07.08, 09	"අමයුරු පියමඟ -32- හම්බන්තොට දිස්ත්‍රික්කය" වැඩසටහන යටතේ පහත සඳහන් ගම්මානවල ජංගම සේවා වැඩසටහන් පවත්වන ලදි. ■ අඟුණුකොළපැලැස්ස - ජඳුර ගම්මානය ■ බෙලිඅත්ත - සිටිනාමළුව උතුර ගම්මානය ■ වීරකැටිය -කැප්පෙට්ටියා උතුර ගම්මනය ■ සුරියවැව - බැඳිගන්තොට ගම්මානය ■ තංගල්ල - කහඳාව හා වාඩිගල ගම්මානය ■ තිස්සමහරාම-ජූල් පල්ලම ගම්මානය හා කාවන්තිස්සපුර ගම්මානය
2023.07.08	වයඹ පළාතේ සියලුම මැතිවරණ කොට්ඨාශ ආවරණය වන පරිද්දෙන් ගල්ගමුව යූ.බී. වන්නිනායක ජාතික පාසැල් භූමියේ පැවති ජංගම සේවාව සඳහා සහභාගී වීම.
2023.08.03	සබරගමුව පළාත් සභාව මඟින් මෙහෙයවන "ආණ්ඩුකාර නිල මෙහෙවර" ජංගම සේවය සඳහා සහභාගී වීම.
2023.08.12, 13	කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30ක් ආවරණය වන පරිදි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සංවිධානය කරන ලද රියදුරු බලපත්‍ර ලබා දීමේ වැඩසටහන වෙනුවෙන් ඊට අදාළ වෛද්‍ය පරීක්ෂණ කටයුතු කුරුණෑගල ශාඛාව තුළ සිදු කිරීම.
2023.08.09, 10, 11, 12, 13	බප/ගම් උෆරාපොල මධ්‍ය මහා විද්‍යාලය ජාතික පාසලෙහි පැවති අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනය සඳහා සහභාගී වීම.
2023.09.30	ගාල්ල දිස්ත්‍රික්කයේ නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි පැවති ජංගම සේවාව සඳහා සහභාගී වීම.
2023.08.19	වයඹ පළාතේ ආණමඩුව මැතිවරණ කොට්ඨාශයේ පැවති ජංගම සේවාව සඳහා සහභාගී වීම.

2023.08.22	ආණ්ඩුකාර නිල මෙහෙවර තෝලංගමුව ඩඞ්ලි සේනානායක විද්‍යාලයේ පැවති ජංගම සේවාව සඳහා සහභාගී වීම.
2023.10.14	දොඩංගස්ලන්ද මැතිවරණ කොට්ඨාශයේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති ජංගම සේවාව සඳහා සහභාගී වීම.
2023.10.21	දොඩංගස්ලන්ද මැතිවරණ කොට්ඨාශය පදනම් කරගෙන කවිසිගමුව ශ්‍රී ගාමිණී මධ්‍ය මහා විද්‍යාලයේ පැවති ජංගම සේවය සඳහා සහභාගී වීම.
2023.10.21	මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14ක් ආවරණය වන පරිදි 2023.10.21 දින මඩකලපුව හින්දු විද්‍යාලයේ පැවති ජංගම සේවාව සඳහා සහභාගී වීම.
2023.11.10	රියදුරන් පරීක්ෂා කිරීම සහ අවශ්‍ය උපදේශන සේවා සැපයීම සඳහා මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය තුළ පැවති එක් දින වෛද්‍ය කඳවුර සඳහා සහභාගී වීම.
2023.12.03	හලාවත මැතිවරණ කොට්ඨාශයේ කරුක්කුව සුගතානන්ද මහා විද්‍යාලයේදී පැවති ජංගම සේවාව සඳහා සහභාගී වීම.
2023.12.27, 28, 29, 30, 31	පස්යාල මහ විදුහලේ පැවති අධ්‍යාපනික ප්‍රදර්ශනය සඳහා සහභාගී වීම.





ශ්‍රී ලංකා වරාය අධිකාරිය තුළ පැවැත්වූ ජංගම සේවාව








බප/ගම් උෆරාපොල මධ්‍ය මහා විද්‍යාලය ජාතික පාසලෙහි පැවති අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනයේ දී පැවැත්වූ ජංගම සේවාව

මෙහෙයුම් කටයුතු හා ආයතනික සංවර්ධනය කටයුතු

- වෛද්‍ය සහතික නිකුත් කිරීමේ ප්‍රගතිය



2022 වර්ෂයෙහි රටෙහි පැවති ගැටළුකාරී තත්ත්වය මත වුවද වෛද්‍ය පරීක්ෂණ 847,306ක ප්‍රමාණයක් සිදු කර ඇත. 2021 වර්ෂයට සාපේක්ෂව වෛද්‍ය පරීක්ෂණ 12.03 % ප්‍රමාණයකින් වර්ධනය වී ඇත. 2023 වර්ෂයේ වෛද්‍ය පරීක්ෂණ 917,394ක ප්‍රමාණයක් සිදුකර ඇත. එම අගය 2022 වර්ෂයට සාපේක්ෂව 7.63%ක වර්ධනයකි.

- **සේවක ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

  2023.12.30 දින කුකුළේගඟ ලයා ලෙසර්හිදී සේවක සංවර්ධන ධාරිතා වැඩසටහක් ක්‍රියාත්මක කිරීම මඟින් සේවක මහත්ම/මහත්මීන්ගේ ධනාත්මක ආකල්ප වර්ධනය කිරීම.

- **තොරතුරු තාක්ෂණය භාවිතය.**

  මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය අතර සේවා මාර්ගගත ක්‍රමය ඔස්සේ සම්බන්ධ කර වෛද්‍ය සහතික සුහුරු තාක්ෂණය මඟින් ලබාදීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

2024 වර්ෂයට අදාළ යෝජනා

- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය අතර සේවා මාර්ගගත ක්‍රමය ඔස්සේ සම්බන්ධ කර වෛද්‍ය සහතික සුහුරු තාක්ෂණය මඟින් ලබාදීමේ ක්‍රමවේදයට අදාල ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

මෙහිදී සම්පූර්ණ පරිගණක පද්ධතියේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නව සයිබර් ආරක්ෂණ පද්ධතියක් (ශාඛා කාර්යාල ඇතුළුව) ස්ථාපිත කිරීමට කටයුතු කිරීම.

- ශ්‍රවණාබාධ සහිත පුද්ගලයන්ට කොන්දේසි සහිතව රියදුරු බලපත්‍ර ලබා ගැනීමට අවස්ථාව ලබා දීම උදෙසා වෛද්‍ය සහතික නිකුත් කිරීමේ හැකියාව පිළිබඳ සොයාබලා අවශ්‍ය පහසුකම් සැපයීම.
- වෛද්‍ය නිර්ණායක යාවත්කාලීන කිරීම.
- ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතට අදාළ නියෝග සකස් කිරීම.
- නුගේගොඩ ප්‍රධාන කාර්යාලය තුළ සූර්ය බලයෙන් විදුලිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම.
- ගම්පහ, බදුල්ල සහ පොළොන්නරුව ශාඛා කාර්යාල සඳහා සුදුසු ගොඩනැඟිලි සොයා බලා අදාළ කාර්යාල ස්ථාපිත කිරීමට කටයුතු කිරීම.
- විදුලිය විසන්ධි වන අවස්ථාවන්හිදී කාර්යාල කටයුතු බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වා ගෙන යෑම සඳහා විදුලි ජනක යන්ත්‍ර මිලදී ගැනීම. (ගාල්ල, මඩකලපුව, බදුල්ල)
- මේ වන විට අර්ධ වශයෙන් නිම වී ඇති ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂක හා රියදුරු විවේකාගාරයේ ඉතිරි වී ඇති කාර්යයන් නිම කිරීම.
- මාතලේ ශාඛාව තුළ සවස 03න් පසු විශේෂඥ වෛද්‍ය සේවා ලබා දීමේ නියමු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
- ආයතනයේ සේවක මහත්ම මහත්මීන් පුහුණු වැඩසටහන් සඳහා යොමු කර ආයතනයේ මානව සම්පත් සංවර්ධනය තුළින් සේවාලාභියා තෘප්තිමත් කරගත් ගුණාත්මක සේවාවක් සැපයීම.
- තෝරා ගත් ශාඛා කාර්යාල කිහිපයක් වායුසමනය කිරීම. (නුගේගොඩ - පළමු මහළ, මාතර)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } ඝිඹවි/ඩී/එන්ටීඑමඅයි/එෆ්ඒ/01/2023/43

මඹේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2024 මැයි 13 දින



සභාපති,
ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.ඒ. වික්‍රමරත්න
විගණකාධිපති

Director
F.Y.N.A
Attached
05/24

පිටපත් : 1. ලේකම් - ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ රාජ්‍ය ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } ඝිඹවි/ඩී/එන්ටීඑමඅයි/එෆ්ඒ/01/2023/43

මඹේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2024 මැයි 13 දින

සභාපති,
ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රමිතියේ 76 - 87 ඡේදවලට අනුකූලව ජංගම හා ජංගම නොවන වත්කම් වර්ග කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතෙහි වෙනම දැක්විය යුතු වුවත් ආයතනයේ රු.51,953,115 ක් වූ ලැබිය යුතු ආපදා ණය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ලැබිය යුතු කාල සීමාව මත ජංගම නොවන වත්කම් ලෙස දැක්වීම වෙනුවට එම ණය ශේෂය ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ආ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද රු.55,628,433ක් වටිනා වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) කල්බදු ගිවිසුම් යටතේ ගොඩනැගිලි 2 ක් වසර 3 ක් සඳහා හා ගොඩනැගිලි 2 ක් වසර 5 ක් සඳහා ලබාගෙන තිබුණි. නමුත් ඒ සඳහා ගෙවා තිබූ රු. 4,627,108 ක අලුත්වැඩියා වියදම් ප්‍රාග්ධනිත කර තිබූ අතර එම ප්‍රාග්ධනිත කරන ලද වියදම් ගොඩනැගිලිවල කල් බදු කාල සීමාව තුල ලියා හැරීමට කටයුතු නොකර වසර 40 ක කාලයක් තුල ලියා හැරීමට කටයුතු කර තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂය තුල රු.929,351 ක් අඩුවෙන් එම වියදම් ක්ෂය කිරීම නිසා ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ස්ථාවර තැන්පතු පොළී සඳහා බැංකුව විසින් අයකරන ලද රඳවා ගැනීමේ බදු රු.8,740,974 ක් ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ගිණුම හර කර ස්ථාවර තැන්පතු පොළී ගිණුම බැර කළ යුතු වුවත්, ආයතනයේ ස්ථාවර තැන්පතු පොළී ගිණුම හර කර, රඳවා ගැනීමේ බදු ගිණුම බැර කර තිබුණි. ඒ අනුව පොළී ආදායම හා පොළී මත රඳවා ගැනීමේ බදු එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතු ය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේ දී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේ දී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවා ද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතු ය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. **මා විසින් තවදුරටත්,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	**අනුකූල නොවීම**
(අ)	1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත 3 (ආ) වගන්තිය	පනතේ දක්වා ඇති කර්තව්‍යය අනුව බර වාහන ඇතුළු සියළු වර්ගවල මෝටර් රථ වාහන වල රියදුරන් හා ධාවකයින් පරීක්ෂා කර ඒ රියදුරන් හා ධාවකයන්ට ශාරීරික හා මානසික යෝග්‍යතාවය

		පිළිබඳ සහතික ලබා දීම සිදුකරනු ලැබුව ද රුධිර සීනි මට්ටම 200 ට වැඩි සේවාලාභීන් වෛද්‍ය පරීක්ෂාවෙන් සමත් කර තිබුණු අතර පද්ධති වෛද්‍ය පරීක්ෂණ වාර්තාවේ සේවාදායකයින්ගේ දෘශ්‍ය මට්ටම සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i)	ii වන පරිච්ඡේදයේ 10 වන වගන්තිය	තනතුරකට බඳවා ගනු ලබන නිළධාරියෙකු සෞඛ්‍ය 169 ප්‍රකාරව වෛද්‍ය පරීක්ෂණයට ඉදිරිපත් විය යුතු වුවත්, ආයතනයේ නිළධාරීන් සඳහා එම වාර්තාව ලබා නොගෙන මෝටර් වාහන බලපත්‍රය ලබා ගැනීමට යෝජිත වෛද්‍ය සහතිකය ලබා දී තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 2021/67 මගින් ද රජයේ හා සංස්ථාවල භාවිතා වන ආකාරයේ වෛද්‍ය පෝරමයක් යොදා ගන්නා ලෙස අනුමැති ලබා දී තිබුණ ද, ඒ අනුව ද කටයුතු කර නොතිබුණි.
(ii)	vi වන පරිච්ඡේදයේ 2.1 වගන්තිය අනුව	ස්ථීර වශයෙන් පරිවාසයට යටත් කොට හෝ ගිවිසුමක් පිට හෝ යම් නිලධාරියෙකු තනතුරකට පත් කෙරෙන විට ඒ නිළධාරියා වෙනුවෙන් වර්යා සටහන් පත්‍රයක් වහාම පිළියෙල කළ යුතු අතර නිළධාරියා ඊට කලිනුත් ආණ්ඩුව යටතේ සේවය කර ඇත්නම් එම සේවයේ යෙදී සිටිය ස්ථානවලින් වර්යා සටහන් පත්‍ර ගෙන්වා ගත යුතු නමුත් විගණනයේ දී පරීක්ෂා කරන ලද පුද්ගලික ලිපිගොනු 6 ක වර්යා සටහන් ඇතුළත් කර නොතිබුණි.
(ඇ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 වගන්තිය	යම් කොන්ත්‍රාත්තුවක කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම උල්ලංඝනය කළහොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට පහකට නොඅඩු මුදලක් කාර්ය සාධන සුරක්ෂණයක් ලෙස ලබා ගත යුතු වුවත්, 2022/2023 වර්ෂය සඳහා ආරක්ෂක සේවා සැපයීමට අදාළව කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නීරීක්ෂණය හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

නුගේගොඩ ප්‍රධාන කාර්යාලයේ රියදුරු හා ආරක්ෂක විවේකාගාර ගොඩනැගිල්ලේ පළමු මහළ දින 180කින් ඉදිකිරීමට 2022 පෙබරවාරි 09 දින පෞද්ගලික සමාගමක් සමඟ වැට බදු සහිතව රු.6,629,903ක වටිනාකමට ගිවිසුමකට එළඹී තිබුණි. නමුත් කොන්ත්‍රාත්කරු වෙත 2024 වර්ෂය වන විට රු.7,309,432 ක් ගෙවා තිබුණ ද, ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) ආයතනයට වෛද්‍යවරුන්, පරිපාලන නිළධාරීන්, දත්ත විශ්ලේෂකයන් බඳවා ගැනීමට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය සඳහා අනුමැතිය ලැබී නොතිබීම හේතුවෙන් ආයතනයට අවශ්‍ය වෛද්‍යවරුන් 67 දෙනෙකු ද, පරිපාලන නිළධාරීන් 17 දෙනෙකු ද බඳවා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) 2023 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු රු.14,233,512 ක ශේෂයෙන් වසර 2 සිට 5 දක්වා අය නොවී පවතින ශේෂය රු.2,348,821ක් වන අතර වසර 5ට වැඩි ශේෂය රු.10,546,421ක් වුවත් අදාළ ශේෂයන් අයකර ගැනීමට කළමණාකරණය කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ආපදා ණය මුදල් රු. 51,953,115.00 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමේදී ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස වෙන්කර නොදක්වා තිබුණද නිසි පරිදි අදාළ සේවකයින්ගෙන් එම මුදල් සෑම මාසයක් පාසා අයකර ගැනීමට කටයුතු කර ඇත. මෙමගින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට හෝ වර්ෂයේ ලාභයට කිසිදු බලපෑමක් සිදුවී නොමැත.

2024 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන තුළ ආපදා ණය ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස වෙන් කිරීමට කටයුතු කරමි.

(ආ) ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය සතුව දැනට නමුත් ශුද්ධ ශූන්‍ය අගයක් සහිත වත්කම් රු. 55,628,433.00ක වටිනාකමක් මූල්‍ය ප්‍රකාශනවල දේපළ පිරියත හා උපකරණ යටතේ පවතී. ඒවා ප්‍රත්‍යාගණනය කර නැවත ප්‍රත්‍යාගණන ලාභයක් සහිතව පොත්වලට ගත යුතු බව අප දන්නා කරුණකි. ඉදිරියේදී මෙම වත්කම් සියල්ල ගිණුම්කරණ ප්‍රමිත අංක 07ට අනුව ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට බලාපොරොත්තු වේ.

(ඇ) අනුරාධපුර, කළුතර, මාතර, ත්‍රිකුණාමලය වන ශාඛා කල්බදු කාලය සැළකිල්ලට ගනිමින් එම අදාළ වසර වල අඩුකරන ක්ෂය වූ මුදල වන රු. 929,351.00ක මුදල 2024 මූල්‍ය ප්‍රකාශනයේ සමුච්චිත ලාභයට ගැළපීමට කටයුතු කරමි.

(ඈ) රඳවා ගැනීමේ බදු (withholding tax) ගිණුම්ගත කිරීමේදී මෙම දෝෂය සිදු වී ඇති අතර වර්ෂයේ ආදායම රු. 8,740,974.00 ක ප්‍රමාණයකින් අඩු වී ඇති නිසා, සහ 2024 වර්ෂයේ සමුච්චිත ලාභයට ගැළපීම් සිදුකිරීමට කටයුතු කරමි.

2.2.2.

(අ) සේවාලාභීන්ගේ වෛද්‍ය පරීක්ෂණ සිදුකිරීම සඳහා අවශ්‍ය වන ප්‍රමිතීන් හා වෛද්‍ය නිර්ණායක ආරම්භයේ සිටම හඳුනාගෙන ඇති අතර මේ දක්වා ප්‍රමිතීන් හා නිර්ණායකයන් ශ්‍රී ලංකාව තුළ ඒ ඒ විෂය ක්ෂේත්‍රයට අදාලව පිහිටා ඇති විශේෂඥ වෛද්‍ය විද්‍යාලවල නිර්දේශ සහිතව යාවත්කාලීන කිරීමට කටයුතු කරමි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වෛද්‍ය නීති රීති මාලාවට අනුව රුධිර සීනි මට්ටම 200ට අඩු විය යුතු බවට තීරණය කර තිබුණි. ඒ අනුව සේවාලාභීන් තාවකාලිකව අසමත් කර වෛද්‍ය ප්‍රතිකාරවලින් පසු රුධිර සීනි මට්ටමේ පාලනය කිරීමකින් පසු වෛද්‍ය සහතිකය නිකුත් කිරීම සිදුවිය. 2020 වර්ෂයේදී සේවාලාභින්ට වෛද්‍ය පරීක්ෂණයට ගතවන කාලය අවම කිරීම සඳහා රුධිර සීනි මට්ටම පරීක්ෂා කිරීම නතර කිරීමට යෝජනා ඉදිරිපත් වුවද, බෝ නොවන වර්ගයේ රෝගාබාධවලින් ශ්‍රී ලාංකිකයන්ට දියවැඩියාව සෑදීමේ ප්‍රවණතාවය වැඩි බැවින් එම රෝගාබාධ හඳුනාගැනීමේ වැදගත්කම සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් අවධාරණය කර තිබූ බැවින් රුධිර සීනි මට්ටම් පරීක්ෂණ අඛන්ඩව සිදු කරනු ලබයි. එසේම රුධිර සීනි මට්ටම නියමිත මට්ටමේ නොමැති බවට ප්‍රථම වරට අනාවරණය වන පිරිස මෙන්ම දියවැඩියා රෝගයෙහි සංකූලතා ඇති පිරිසක්ද සොයා ගැනීමට හැකිව ඇත.

උදා : දියවැඩියා රෝගී තත්ත්වය හේතුවෙන් ඇස් පෙනීමේ මට්ටම වෙනස් වීම.

ඒ අනුව වෛද්‍ය පරීක්ෂණයේදී රුධිර සීනි මට්ටම පරීක්ෂාව වැදගත් වේ. දියවැඩියා රෝගයේ සංකූලතා නොමැති විට රුධිරයෙහි සීනි මට්ටම 200mg/dl ප්‍රමාණයට වැඩි වුවත් වෛද්‍ය සහතික නිකුත් කිරීම සිදු වේ.

කෙසේ වෙතත් රුධිරයේ සීනි මට්ටම පරීක්ෂා කිරීමේදී රිය ධාවනය සඳහා සුදුසු වන නියමිත රුධිර සීනි මට්ටම කුමක්ද යන්න පිළිබඳව අන්තරාසර්ග විශේෂඥ වෛද්‍ය විද්‍යාලය වෙත අවස්ථා තුනකදී ලිපි යොමු කර ඇති අතර, දුරකථනය මගින් අවස්ථා ගණනාවකදීම විමසීම් සිදු කර ඇත. එහෙත් මෙතෙක් ඒ සඳහා පිළිතුරු ලැබී නොමැත.

ආරම්භයේ සිටම මේ දක්වා සිදු කරන ලද වෛද්‍ය පරීක්ෂණයක් නැවැත්වීම සඳහා විශේෂඥ වෛද්‍ය විද්‍යාල මගින් උපදෙස් අවශ්‍ය වන බැවින්, කායික රෝග විශේෂඥ වෛද්‍ය විද්‍යාලය වෙතද කඩිනමින් ලිපියක් යොමු කිරීමට කටයුතු කරනු ඇත.

සියලුම වෛද්‍යවරුන් වෙත පරිගණක ලබා දී ඔවුන්ට පද්ධතිය හරහා අක්ෂි පරීක්ෂා තත්ත්වයන් ඇතුළත් කිරීමට අවස්ථාව ලබා දීමට කටයුතු කරමින් පවතී.

(ආ) (I) මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යොමු කර අනුමැතිය හිමි වුවද නව වෛද්‍ය පෝරම භාවිතයට ගැනීම සම්බන්ධයෙන් හිටපු සභාපතිතුමාගේ අනුමැතිය හිමි නොවීය. නමුත් මේ පිළිබඳව නැවත සාකච්ඡා කර වෛද්‍ය සහතිකය පිළිබඳව ඉදිරියේදී තීරණයක් ගැනීමට කටයුතු කරනු ලැබේ.

(II) අප ආයතනය සඳහා උචිත ආකාරයේ චර්යා සටහන් පත්‍රයක් සකස් කර ඉදිරියේදී ලිපිගොනු සඳහා ඇතුළත් කිරීමට උපදෙස් ලබා දී ඇත.

(ඇ) 2021/2022 වර්ෂවල පැවති කොවිඩ් වසංගත තත්ත්වයත් සමඟ සේවාලාභීන් සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් මත මෙහෙයවීමට අවශ්‍ය වූ බැවින් නව සමාගමකින් ආරක්ෂක සේවය ලබා ගැනීම එවකට පැවති තත්ත්වය හමුවේ සාර්ථක නොවන බැවින් පැවති ආයතනයෙන්ම සේවාව ලබා ගන්නා ලදී. කෙසේ වෙතත් රක්නා ලංකා ආරක්ෂක සේවා ආයතනය රජය සතු සමාගමක් වීම, පෙර වසරේ සඳහන් මිල ගණන් යටතේම සේවය ලබා ගැනීමට හැකිවීම හා දිවයින පුරා ආවරණය වන පරිදි සේවාව නිසිපරිදි සැපයීම මත මෙම ආරක්ෂක ආයතනය මගින් සේවය ලබාගන්නා ලදී. එබැවින් 2020/2021 වර්ෂය සඳහා පමණක් කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගෙන ඇත.

2.2.4

එම කොන්ත්‍රාත්තුව 2022 මාර්තු 02 වන දිනසිට දින 180 ක කාලයකින් නිම කිරීමට ගිවිසුම්ගතව වැඩ කරගෙන යන අතරතුර එවකට රට තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල සීඝ්‍ර ලෙස ඉහල ගිය අතර, කොන්ත්‍රාත්කරු මිල වැඩිවීමක් ඉල්ලා සිටින ලදී. ඒ අනුව ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන ලද අතර, මෙම මිල වැඩිවීම සංශෝධනයෙන් ඉංජිනේරු සහය ඉංජිනේරු නෙරංජලී පෙරේරා මියගෙන් ලබා ගන්නා ලදී.

දැනට නිමකර ඇති වැඩවලට අදාළව කොටස් වශයෙන් පහත පරිදි අවස්ථා 05 දී රු. 7,309,432 ක මුදක් ගෙවීම් සිදු කර ඇත.

එසේම, 2022.08.08 දින මුදල්, ආර්ථික ස්ථායීකරන සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් නිකුත් කළ 2022/04 චක්‍රලේඛයට අනුව ප්‍රාග්ධන වියදම් සිදු කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගතයුතු විය. එම අනුමැතිය සඳහා ඉල්ලුම් කළ අතර, එම අනුමැතිය අපහට හිමිවූයේ 2023.04.25 දින වේ.

නමුත් ගිවිසුම්ගත වූ මිල ගණන්වලට කොන්ත්‍රාත්තුව කරගෙන යාම සඳහා කොන්ත්‍රාත්කරු එකඟ නොවූ අතර, මේ බව සඳහන් කර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කරන ලදී. එහිදී ලබාදුන් තීරණය වන්නේ කොන්ත්‍රාත්කරුගෙන් පමා ගාස්තු අයකර ගන්නා ලෙසත්, මෙම කොන්ත්‍රාත්තුව සඳහා නව කොන්ත්‍රාත්කරුවකු තෝරාගන්නා ලෙසත්ය.

නමුත් නව කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමට නම් පැරණි කොන්ත්‍රාත්තුවට අදාළව ගිවිසුම අවලංගු කරගත යුතු වන අතර, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව පමා මුදල් අයකර ගැනීමට නොහැකි වී ඇත. මක්නිසාද යත් කොන්ත්‍රාත්තුව ප්‍රමාද වීමට ප්‍රධාන සාධකය වූයේ කොවිඩ් 19 උවදුර පැමිණීම, කොන්ත්‍රාත් අමුද්‍රව්‍යවල මිල සීඝ්‍ර ලෙස ඉහලයාම සහ රාජ්‍ය වියදම කළමනාකරණය යන චක්‍රලේඛයට අනුව අනුමැතිය ලබා ගැනීම යන කරුණු වේ.

මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් 2024.01.23 දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙතද ඉදිරිපත් කරන ලදී. එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

කළමනාකරණය මේ සම්බන්ධයෙන් අවස්ථා රාශියකදී කටයුතු කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා කිහිපයක්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලදී. එසේම අප රාජකාරී කළයුත්තේ වර්තමානයේ රජය විසින් වරින් වර නිකුත් කරන රාජ්‍ය වියදම කළමනාකරණය චක්‍රලේඛ වලට අනුව වේ. ඉහත කරුණු හේතුවෙන් 2023 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම අනුව මෙම කාර්යය නිම කර ගැනීමට නොහැකි වී ඇත.

2.3 වෙනත් කරුණු

(අ) ආයතනය තුළ ස්ථීර වෛද්‍ය නිලධාරීන් සිටිනුයේ සුළු ප්‍රමාණයකි. ස්ථීර වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීමට දීර්ඝ කාලයක සිට පුවත්පත් දැන්වීම් පළකරමින් උත්සාහ කළද, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් හා දීමනා මත අපගේ ආයතනයෙන් වෛද්‍ය නිලධාරීන්ට ගෙවනු ලබන දීමනා අඩු බැවින් ස්ථීර පදනම මත වෛද්‍ය නිලධාරීන් ආයතනයේ සේවයට පැමිණීමට අකමැත්තක් දක්වයි. එබැවින් කොන්ත්‍රාත් පදනම මත හා දෛනික පැය පදනම මත වෛද්‍ය නිලධාරීන් බඳවා ගෙන සේවාලාභීන් අපහසුතාවයට පත් නොවන පරිදි සේවය අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබයි.

පරිපාලන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වූ පසු බඳවා ගැනීමේ කටයුතු සිදු කළ හැකිය.

(ආ) මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය අතර සාකච්ඡාවන් සිදුකරමින් පවතින අතර මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ඉදිරියේදී තීරණයක් ලබා ගනු ඇත.

2023 වර්ෂයේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග

- **යටිතල පහසුකම් සංවර්ධනය**

  ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වවුනියාව ශාඛාව, වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ ගොඩනැගිල්ලක ස්ථාපනය කිරීමට කටයුතු කිරීම සහ මාසික කුලී පදනම මත තෝරා ගත් නුවරඑළිය ශාඛා කාර්යාලයේ අභ්‍යන්තර ව්‍යූහය සකස්කර නවීකරණ කටයුතු සිදු කිරීම.

- **මහජනතාවට වඩා යහපත් සේවාවක් ලබා දීම සඳහා සේවා පුළුල් කිරීම සහ ක්‍රමවේදයන් හඳුන්වාදීම. ජංගම සේවාවන් හා ප්‍රදර්ශන ක්‍රියාත්මක කිරීම.**

දිනය	ස්ථානය
2023.01.09, 10	ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සවුත් ඒසියා ගෙට්වේ ටර්මිනල් (SAGT) ආයතනයේ සේවකයින් සඳහා ජංගම රියදුරු බලපත්‍ර යාවත්කාලීන කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
2023.01.05, 06, 07	මහර වෙසක් කලාපයේ වෛද්‍ය සායනයට සහභාගී වීම.
2023.05.28	"සුරැකි මඟකට තබමු පියවර" යන තේමාව පෙරදැරිව ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සියලුම ග්‍රාම නිලධාරි වසම්වල වෙසෙන පුද්ගලයන් හට සහනදායි වැඩපිළිවෙලක් මඟින් රියදුරු බලපත්‍ර ලබා දීමේ වැඩසටහනේ පළමු පියවර මාතලේ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන භූමිය තුළ ක්‍රියාත්මක කිරීම.
2023.06.03, 04, 05	ධර්ම රෂ්මි හෝමාගම, පිටිපන පොසොන් කලාපයේ පැවති වෛද්‍ය සායනයට සහභාගී වීම.
2023.07.08, 09	"අමයුරු පියමඟ -32- හම්බන්තොට දිස්ත්‍රික්කය" වැඩසටහන යටතේ පහත සඳහන් ගම්මානවල ජංගම සේවා වැඩසටහන් පවත්වන ලදී. ■ අඟුණුකොළපැලැස්ස - ජඳුර ගම්මානය ■ බෙලිඅත්ත - සිටිනාමළුව උතුර ගම්මානය ■ වීරකැටිය -කැප්පෙට්ටියා උතුර ගම්මනය ■ සුරියවැව - බැදිඟන්තොට ගම්මානය ■ තංගල්ල - කහඳාව හා වාඩිගල ගම්මානය ■ තිස්සමහරාම - ජූල් පල්ලම ගම්මානය හා කාවන්තිස්සපුර ගම්මානය
2023.07.08	වයඹ පළාතේ සියලුම මැතිවරණ කොට්ඨාශ ආවරණය වන පරිද්දෙන් ගල්ගමුව යූ.බී. වන්නිනායක ජාතික පාසැල් භූමියේ පැවති ජංගම සේවාව සඳහා සහභාගී වීම.

2023.08.03	සබරගමුව පළාත් සභාව මඟින් මෙහෙයවන "ආණ්ඩුකාර නිල මෙහෙවර" ජංගම සේවය සඳහා සහභාගී වීම.
2023.08.12, 13	කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30ක් ආවරණය වන පරිදි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සංවිධානය කරන ලද රියදුරු බලපත්‍ර ලබා දීමේ වැඩසටහන වෙනුවෙන් ඊට අදාළ වෛද්‍ය පරීක්ෂණ කටයුතු කුරුණෑගල ශාඛාව තුළ සිදු කිරීම.
2023.08.09, 10, 11, 12, 13	බප/ගම් උගරාපොල මධ්‍ය මහා විද්‍යාලය ජාතික පාසලෙහි පැවති අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනය සඳහා සහභාගී වීම.
2023.09.30	ගාල්ල දිස්ත්‍රික්කයේ නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි පැවති ජංගම සේවාව සඳහා සහභාගී වීම.
2023.08.19	වයඹ පළාතේ ආණමඩුව මැතිවරණ කොට්ඨාශයේ පැවති ජංගම සේවාව සඳහා සහභාගී වීම.
2023.08.22	ආණ්ඩුකාර නිලමෙහෙවර තෝලංගමුව ඩඩ්ලි සේනානායක විද්‍යාලයේ පැවති ජංගම සේවාව සඳහා සහභාගී වීම.
2023.10.14	දොඩංගස්ලන්ද මැතිවරණ කොට්ඨාශයේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති ජංගම සේවාව සඳහා සහභාගී වීම.
2023.10.21	දොඩංගස්ලන්ද මැතිවරණ කොට්ඨාශය පදනම් කරගෙන කවිසිගමුව ශ්‍රී ගාමිණී මධ්‍ය මහා විද්‍යාලයේ පැවති ජංගම සේවය සඳහා සහභාගී වීම.
2023.10.21	මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14ක් ආවරණය වන පරිදි 2023.10.21 දින මඩකලපුව හින්දු විද්‍යාලයේ පැවති ජංගම සේවාව සඳහා සහභාගී වීම.
2023.11.10	රියදුරන් පරීක්ෂා කිරීම සහ අවශ්‍ය උපදේශන සේවා සැපයීම සඳහා මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය තුළ පැවති එක් දින වෛද්‍ය කඳවුර සඳහා සහභාගී වීම.
2023.12.03	හලාවත මැතිවරණ කොට්ඨාශයේ කරුක්කුව සුගතානන්ද මහා විද්‍යාලයේදී පැවති ජංගම සේවාව සඳහා සහභාගී වීම.
2023.12.27, 28, 29, 30, 31	පස්යාල මහ විදුහලේ පැවති අධ්‍යාපනික ප්‍රදර්ශනය සඳහා සහභාගී වීම.

- **සේවක ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

  2023.12.30 දින කුකුළේගඟ ලයා ලෙසර්හිදී සේවක සංවර්ධන ධාරිතා වැඩසටහක් ක්‍රියාත්මක කිරීම මඟින් සේවක මහත්ම/මහත්මීන්ගේ ධනාත්මක ආකල්ප වර්ධනය කිරීම.

- **තොරතුරු තාක්ෂණය භාවිතය.**

  මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය අතර සේවා මාර්ගගත ක්‍රමය ඔස්සේ සම්බන්ධ කර වෛද්‍ය සහතික සුහුරු තාක්ෂණය මඟින් ලබාදීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා


මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

වත්කම්	සටහන් අංක	2023 රු. ශත	2022 රු. ශත
ජංගම නොවන වත්කම්			
ස්ථාවර වත්කම් හා උපකරණ	4	245,831,584.27	254,842,153.04
නොනිමි වැඩ - ඉදිකිරීම්		10,447,097.27	14,520,433.73
ආයෝජන	5	2,291,911,135.37	1,432,374,227.03
ආයෝජන - පාරිතෝෂික අරමුදල	6	94,393,645.49	80,776,352.46
එකතුව - ජංගම නොවන වත්කම්		2,642,583,464.40	1,782,513,166.26
ජංගම වත්කම්			
තොගය	7	32,423,808.15	38,179,067.12
ලැබිය යුතු ගිණුම්	8	14,233,511.88	14,821,254.08
වෙනත් ලැබිය යුතු	9	186,368,022.57	239,921,144.18
මුදල් සහ මුදල් සමාන වත්කම්	10	6,058,110.18	3,201,050.85
ජංගම වත්කම් එකතුව		239,083,452.78	296,122,516.23
		2,881,666,917.18	2,078,635,682.49
ස්කන්ධ හා වගකීම්			
ප්‍රාග්ධනය		62,099,697.33	62,099,697.33
ප්‍රාග්ධනය හා සංචිතය		22,682,287.89	22,682,287.89
පොදු සංචිතය		1,912,102,685.01	1,804,071,674.53
මුළු හිමිකම		1,996,884,670.23	1,888,853,659.75
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික වෙන්කිරීම්	11	115,101,955.00	117,041,805.00
ගෙවිය යුතු විශ්වාස රක්ෂණ ඇප	11	117,244.26	114,976.26
		115,219,199.26	117,156,781.26
ජංගම වගකීම්			
ගෙවිය යුතු ගිණුම්	12	729,989,872.37	42,196,907.12
උපචිත වියදම්	13	17,933,907.16	14,573,516.33
අනෙකුත් ගෙවිය යුතු	14	21,639,266.16	15,854,818.03
		769,563,045.69	72,625,241.48
වත්කම් හා වගකීම් එකතුව		2,881,666,915.18	2,078,635,682.49

